# කන්දෙස්කිරියාව...



## කරතකොලොම්බන්

ඒයි කොල්ලො, අඹ ගහට ගල් ගහන්න කලින් ඔය අඹ ගහේ විස්තරේ උඹ දන්නවාද කියල කියපන්. ඔය ගහ මං හිටෙව්වේ නවසිය හැත්තෑ හතරේදී. ඒ කාලේ පාරෙ ගෙදර සෝමපාල මස්සිනා වැඩකරේ කිලිනොච්චියේ මිනින්දෝරු පාටියේ. මිනිහා කාලතුරකින් ගමේ එනකොට ඒ පළාතේ තියෙන දේවල් ගේනවා. එක දවසක් ඉදිච්ච අඹ පෙට්ටියක් ගෙනාවා. එදා තමයි මං ඔය කරතකොලොම්බන් කියන අඹ කෑවේ. මං උන්දැගෙන් ඇහුවා ඒ අඹ වල ඇට හිටවන්නද කියලා. උන්දෑ කීවා ඔය අඹ ඇට හිටවන්ට එපා. මං උඹට හොඳ බද්ධ අඹ පැළයක් ගෙනත් දෙන්නම් කියලා. බද්ධ අඹ කියන්නේ වල් අඹ පැළේකට හොඳ ජාතියේ අඹ අතු කෑල්ලක් හයි කරලා කියලයි සෝමපාල මස්සිනා කීවේ. ඉතින් ඊළඟ වතාවේ ගමේ එනකොට කිලිනොච්චියේ ඉඳලා මට ඔය අඹ පැළේ ගෙනත් දුන්නා. ඒ කොරලා එකේ විස්තරේ මට කියලා දුන්නා. කිලිනොච්චිය පැත්තේ ගමක පොන්නම්බලම් කියලා දෙමළ මහත්තයෙක් හිටියලු. ඒ මහත්තයා ඒ පළාතේ වල් අඹ ඇට එකතුකොරගෙන ඇවිත් අඩියක් විතර උස උණ පුරුක් වලට පොහොර පස් දාලා ඒකේ අර වල් අඹ ඇට එක ගානේ පැළ කරනවලු. එව්වා පැළවෙනකොට ඒ පැළේ තියෙන උණ පුරුක ඔය හොඳට ගෙඩි හැදෙන කරතකොලොම්බන් ගහක අත්තකට කියලා කම්බියකින් ගැට ගහනවලු. ඊගාවට උණ පුරුකේ තියන වල් අඹ පැළේ තැනකින් පලුදු කරලා කරතකොලොම්බන් ගහේ තියෙන පොඩි අතු කෑල්ලකුත් පලුදු කරලා පලුදු කරපු තැන් දෙකම එකට ගෑවෙන විදිහට තියලා ඉටිකොල පටිවලින් වෙලනවලු. සති දෙක තුනක් යනකොට වල් අඹ පැළේට හොඳ අඹ අතු රිකිල්ල පෑහෙනවලු. එතකොට හොඳ අතු රිකිල්ල පරෙස්සමෙන් මහ ගහෙන් වෙන්කරනවලු. ඊට පස්සේ වල් අඹ පැළේ මුදුනත් කපලා ටික කාලයක් තද අව්ව නොවදින තැනක තියලා තියෙනවලු.

එතකොට උණ පුරුකේ තියෙන අඹ පැළේ යට කෑල්ල වල් අඹ, උඩ කෑල්ල කරතකොලොම්බන් විදියට තමයි තියෙන්නේ. ඒ මහත්තයා ඒ පැළ ලෑන්මාස්ටරේ දාගෙන ඉරිදා පොළට ඇන්නගෙහුං රුපියල් පහලොව ගානේ විකුණනවලු. ගෙනියන පමාවට ඒවා විකිණෙනවලු. ඉතිං සෝමපාලයා ඒ මහත්තයගෙන් රුපියල් පහලොවක් දීලා ගෙනාපු අඹ පැළේ මං උණ පුරුක පිටින්ම හිටෙව්වා.

ඔය බද්ධ අඹ පැළ අඩු වයසෙන් පීදෙනවා. මේ පැළෙත් අවුරුදු හතරෙන් පීදුනා. ඒ කාලේ අහල ගං හතක වත් තිබුනේ නෑ මේ වගේ ගෙඩි හැදෙන අඹ ගහක්.

පස්සෙන් පහු වෙනකොට කෘෂිකර්මෙන් මේ පළාතට බද්ධ අඹ පැළ ගෙනත් බෝ කරා. ඒ පැළ ඔක්කෝටම වැඩිය වයස වැඩියි ඔය අඹ ගහට. ඒ කාලේ හිටිය සමරනායක කෘෂිකර්ම ඩිරසියල් මහත්තයා හොඳට ගෙඩි අල්ලන විදිහට අඹ අතු කප්පාදු කරන හැටි මට කියලා දුන්නා. ඒක තමයි බොහොම ලස්සනට අතු විහිදිලා තියෙන්නේ. ඔය ගහේ ඉදිච්ච පළවෙනි අඹ ගෙඩිය මං පූජා කරේ බෝධිමල්කඩ පන්සලට ඕං.

සිලිං අත්තා.